## ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2018

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16හි 79(බී) ඡේදය ප්‍රකාරව, මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් දැනට භාවිතයේ පවතින රු.48,119,068 ක් වූ කාර්යාල උපකරණ, රසායනාගාර උපකරණ ,ලීබඩු හා සවිකිරීම් සහ පරිඝණක උපකරණ යනාදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදෙන ලෙස රජයේ තක්සේරුකරු වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.ඒ අනුව 2019 සැප්තැම්බර් 30 දින වන විට සියළු වත්කම්වල ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16හි 79(බී) ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනයකර ගිණුම්ගත කලයුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විදේශ තේ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදලින් තානාපති කාර්යාල වෙත සමාලෝචිත වර්ෂයේ දී ලබා දෙනු ලැබූ රු. 758,353 ක් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2019 වර්ෂයේ සිට නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | විදේශ තේ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා ලබා දෙනු ලබන මුදල් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කලයුතුය. |
| (ආ) චීන තේ ප්‍රවර්ධන ඒකකය සඳහා මිලදීගන්නා ලද වාහනය වෙනුවෙන් චීන රජය විසින් මණ්ඩලයට ආපසු ගෙවන ලද රු.889,870 (RMB 33,389.74) ක එකතුකළ අගය මත බදු (වැට්) ගිණුම්ගතකර නොතිබුණි. | චීන රජය මගින් චීන තානාපති කාර්යාලය වෙත ආපසු ගෙවන ලද RMB 33,389.74 ක එකතු කල අගය මත බදු මුදල ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත 2019 වර්ෂයේදි ගෙන්වා ගෙන ගිණුම්ගත කිරිමට පියවර ගනු ලැබේ. | ආපසු ගෙවන ලද එකතුකළ අගය මත බදු (වැට්) ගිණුම්ගත කලයුතුය. |
| (ඇ)රුසියානු තේ ප්‍රවර්ධන ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදීගන්නා ලද වාහනය වෙනුවෙන් දරන ලද රු.898,086 (RUB 12,910.77) ක තීරුබදු ගාස්තු හා ලියාපදිංචි ගාස්තු වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | රුසියාවේ තේ ප්‍රවර්ධන ඒකකය සඳහා මිලදි ගන්නා ලද වාහනය වෙනුවෙන් තීරු බදු ගාස්තු හා ලියාපදිංචි වටිනාකම් සඳහා ගෙවිමට අදාල ගිණුම් ගැලපිලි 2019 වර්ෂයේදි සිදුකර ඇත. | වාහන මිලදීගැනීමේදී දරන ලද තීරුබදු ගාස්තු හා ලියාපදිංචි ගාස්තු වටිනාකම ගිණුම්ගත කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) තානාපති කාර්යාල යන්හි පවතින මණ්ඩලයට ලැබිය යුතු රු.2,411,855 ක මුදල, ණයගැතියෝ යටතේ දක්වනු වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂ අවසාන මුදල් හා මුදල් හා සමාන දෑ ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේදි නිවැරදිව කටයුතු කිරිමට සටහන් කර ගතිමි. | තානාපති කාර්යාලයන්හි පවතින මණ්ඩලයට ලැබිය යුතු මුදල් ණයගැතියෝ යටතේ දැක්විය යුතුය. |
| (ඉ) රු.2,155,202 ක වටිනාකමකට පිරිනමන ලද, පරිපාලන ගොඩනැගිල්ල පින්තාරු කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ, සමාලෝචිත වර්ෂයේ දී ආරම්භකර නොතිබියදි, එම වටිනාකම ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාල අලුත්වැඩියාව සම්බන්ධයෙන් 2018.12.07 දින කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකර ඇති හෙයින් එම වර්ෂය සඳහා ගෙවිය යුතු ප්‍රතිපාදන ලෙස ගිණුම් ගත කර ඇත. | වැඩ ආරම්භ නොකරනලද කොන්ත්‍රාත් වටිනාකම් ගිණුම්ගත නොකල යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ)ජපාන තානාපති කාර්යාල යෙන් ලැබිය යුතු ශේෂය | 189,839 | 1,944 | 187,895 | 2018 වර්ෂයේ ගිණුම් පිළියෙල කරන දින වන විට ජපාන තානාපති කාර්යාලයෙන් 2018 වර්ෂයේ 2018.06.30 සිට 2018.12.31 දක්වා වු කාලයට | තානාපති කාර්යාල වියදම් විස්තර කඩිනමින් ගෙන්වා ගැනීමට හා ගිණුම්ගත කිරීම කලයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අදාල වවුචර් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ලැබී නොතිබුනු හෙයින් ගිණුම් ගත කිරීමට නොහැකි විය. අදාල ගිණුම් ගැලපීම් 2019 වර්ෂයේදී සිදුකර ඇත. | |
| (ආ) එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් හා බැංකු ශේෂය | 1,279,771 | 894,099 | 385,672 | විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධි කාරි සමහ අවස්ථා කිහිපය කදිම සාකච්ඡා කරන ලදි. එහෙත් මේ පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඔවුන් සතුව නොමැති බව සඳහන් කරන හෙයින් ඉදිරියේදි මේ සම්බන්ධයෙන් නිවැරැදි ක්‍රියා මාර්ග ගැනිමට අවශ්‍ය කටයුතු කිරිමට සටහන් කර ගතිමි. | මණ්ඩලය සතු තොරතුරු ඉදිරිපත් කරමින් නිවැරදි ශේෂය ගිණුම් ගතකිරීමට හා ගණුදෙනු යාවත් කාලීන අයුරින් පවත්වාගෙන යායුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ)ප්‍රචාරන හා ප්‍රවර්ධන අරමුදල -විවිධ ණයගැතියෝ | 643,432 | ශේෂ සනාථකිරීම්, විස්තරාත්මක උපලේඛණ | සනාථ කිරීමේ උප ලේඛණ ලැබුණු පසු විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | සනාථ කිරීම් කාලීනව ලබාගැනීමට කටයුතුකලයුතුය. |
| (ආ) ප්‍රවර්ධන හා ප්‍රචාරන කටයුතු සිදුකිරීම සඳහා ප්‍රංශ තානාපති කාර්යාලය වෙත ප්‍රේෂණය කරනලද මුදල් | 758,353 | වියදම් විස්තර | තානාපති කාර්යාලයෙන් තොරතුරු ලබාගත් විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වියදම් විස්තර ලබාගැනීමට කටයුතු කලයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) ජයිකා ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම් | 279,507 | වියදම් දැරීම සඳහා අධිකාරිය තහවුරු කරන ලියවිලි | ව්‍යාපෘතියට අදාල ලියවිලි මේ සමඟ අමුණා ඇත. | අධිකාරිය බලය සහිත වියදම් පමණක් දැරියයුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස කර්මාන්තශාලාවක් සඳහා ලබා දී තිබූ රු.3,489,773ක මුදල දළු සැපයුම්කරුවන් වෙත ලබාදී නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල ආපසු අයකර ගෙන නොතිබුණි. | අදාල මුදල එම කර්මාන්තශාලාවලින් අයකර ගැනිමට දැනට නිතිමය කටයුතු කරමින් පවති. | නිතිමය කටයුතු කඩිනමින් ඉටුකර තත්වය නිවැරදි කලයුතුය. |
| (ආ) 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ සටහන් අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු රු.25,000,000 ක් වෙනුවෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "සිලෝන්ටී මියුසියම්" හි අයිතිය අත්කර ගැනීම හා ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබූ නමුත් කළමණාකරනය 2019 මාර්තු 31 දක්වාම මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් " සිලෝන් ටී මියුසියම් " පිහිටි හන්තානයේ ඉඩම පවරා දීමට එවකට එකඟ වුවත් මේ වන විට එම එකඟතාවය ඉවත් කරගෙන ඇත. ඒ වෙනුවට ඔවුන් විසින් තේ මණ්ඩලය සමග තිස් අවුරුදු බදු ගිවිසුමකට එළඹීමට තීරණය කර ඇති අතර මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවති. | දෙපාර්ශවය එකඟ වී ණයමුදල කඩිනමින් අයකරගැනිමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තනාපති කාර්යාල වෙත ලබා දුන් රු. 51,604,457ක මුදලින් ඉතිරි වූ රු.1,884,779 ක මුදල 2019 අප්‍රේල් මාසය දක්වාම අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු මුදල් 2019 වර්ෂයේදි හැකිතාක් දුරට අයකර ගැනිමට සටහන් කර ගතිමි. | විශේෂිත කාර්යයන් සඳහා ලබාදුන් මුදලින් ඉතිරි මුදල් කාර්යය නිමවූවිගස අයකර ගැනීමට කටයුතු කලයුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනිම සඳහා දළු සැපයුම් කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් ඉතිරි රු.1,523,148 ක් 2015 දෙසැම්බර් 31 දින සිට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි. | අමු තේ දළු සැපයුම්කරුවන්ගේ බිල්පත් හා අමු තේ දළු වෙළෙන්දන්ගේ ගෙවිම් ලේඛණවල තිබූ නොගැලපිම් හඳුනාගෙන ඇති හෙයින් එම ගැටළුව නිරාකරණය කිරිම සඳහා දැනටමත් පරිඤණයක් පැවැත්වෙන අතර එම පරිඤණ අවසන් කිරිමෙන් පසු අදාල මුදල් දළු වෙළඳුන් හට ගෙවිමට කටයුතු කරනු ලැබේ. 2019 ජුනි 30 වන විට සියළු ගෙවිම් නිමකිරිමටත්, එලෙස කටයුතු කිරිමට නොහැකි වුවහොත් එම මුදල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරිමටත් කටයුතු කරනු ලැබේ. | පරීක්ෂණ කටයුතු කඩිනම්කර ඉතිරි මුදල් භාණ්ඩාගාර යට ප්‍රේශණය කිරිමට කටයුතු කලයුතුය. |
| (ආ)විවිධ කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් රඳවාගන්නා ලද මුදල් රු. 3,014,243 ක් වසර දෙකක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් දැනුවත් කර නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබේ. | අදාල පාර්ශව හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කිරීම කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)තේ කම්හල් හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති රු. 6,850,840 ක් වසර 01 සිට වර්ෂ 16 දක්වා ඇතත් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතුවලින් අවුරුදු 6 කට වඩා පැරණි තැන්පතු ප්‍රමාණය රු. 3,206,392.85 වන අතර එම තැන්පතු වලට අදාල සැපයුම්කරුවන්ගේ විස්තර සොයා ගැනිමට අපහසු වී ඇත. ඉතිරි තැන්පතු සඳහා අදාල සැපයුම්කරුවන්ගේ විස්තර මේ වන විට නිරවුල් කරමින් පවතින අතර ඊට අනුකූලව ගෙවීම් කිරිමට කටයුතු කරනු ලැබේ.ඉහත සඳහන් මුදල ලබාගැනිමට ඉදිරියේදි යම් පුද්ගලයෙකු තම අනන්‍යතාවය සහතික කර ඉදිරිපත් වුවහොත් එම මුදල ගෙවිමට කටයුතු කරනු ලැබේ. | නිරවුල් කලයුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ)1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව සෙස් බදු අයකිරිම මණ්ඩලය මගින් සිදුකළයුතු නමුත් ඊට පටහැනිව සෙස් බදු අයකිරිම මහා භාණ්ඩාගාරය සිදු කර තිබූ නමුත් ඒ සඳහා තේ මණ්ඩල පනත සංශෝධනය කර නොතිබුණි. | ආරම්භයේදි තේ මණ්ඩල පනත යටතේ සඳහන් විධිවිධාන අනුව තේ මණ්ඩලය විසින් සෙස් බදු අයකිරිම සිදුකරන ලද නමුත්, පසුව සම්මත කරන ලද අපනයන සංවර්ධන මණ්ඩල පනත මගින් සෙස් බදු අයකිරිම මහ භාණ්ඩාගාරය විසින් පවරාගෙන ඇත. තේ මණ්ඩල පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරිමට අවශ්‍ය උපදෙස් නිතිපතිවරයාගෙන් ලබාගැනිමට කටයුතු කරනු ලැබේ. | නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු කලයුතුය. |
| ආ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මණ්ඩලය විසින් මානව සම්පත් කලමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් | අදාල කාර්ය පටිපාටි අත්පොත සකස් කරමින් පවති | කාර්ය පටිපාටි අත්පොත කඩිනමින් සකස් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් අත්පොත් සකස්කර නොතිබුණි. | | |
| ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. මුදල් රෙගුලාසි 835(2) (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ල සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු කුලීවටිනාකම රු. 93,500ක් වුවද, එම වටිනාකම ඉක්මවා රු. 115,000 ක් බැගින් වූ මාසික කුලි වටිනාකමට ගෙන තිබූ නමුත් මුදල් රෙගුලාසිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙනගිය ගොඩනැගිල්ල 2017 ජුනි මස 30 වන දින හිමිකරුට භාර දිම සිදු වූ බැවින් එම ප්‍රාදේශීය කාර්යාලය අනිවාර්යෙන්ම 2017.07.01 දින වෙනත් ස්ථානයක ස්ථාපිත කිරිම අවශ්‍ය වූ හෙයින් තක්සේරුකරුගේ තක්සේරු මුදල වන රු. 93,500/- ට වඩා වැඩි කුලියකට එනම් මාසිකව රු.115,000/- කුලියකට බඳු ගෙන ඇති අතර ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා එම අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | බදු පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුය. |
| ඈ)2018 සැප්තැම්බර් 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග | මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබූ, 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය හා රු.5,592,421 ක් වැයකර මිලදී ගන්නා ලද CP-3800 GAS Chromatography යන්ත්‍රය මේ දක්වා නිශ්කාර්යව පැවැතිණි. | 2018.09.25 දිනැති .අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දි පත්‍රිකා අංක 2018/480/288 යටතේ LCMS යන්ත්‍රය අළුත් වැඩියා කර නැවත භාවිතයට ගැනිම සඳහා රුපියල් ලක්ෂ දහයක ඇස්තමේන්තුවක් අනුමත කරන ලදි. LCMS යන්ත්‍රයේ සැපයුම් ඒජන්ත හා වත්මන් ඒජන්ත වරුන් කැඳවා අදාල උපකරණයේ අළුත්වැඩි යාවන් කිරිමට කටයුතු කලත් 2019.05.09 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයට රැස්විමේදි දැනුම් දුන් පරිදි එම යන්ත්‍රය නැවතත් ක්‍රියාත්මක කිරිම | භාණ්ඩ බාරගැනී මට පූර්වයෙන් අපේක්ෂිත කාර්ය ය සඳහා යොදාගත හැකිබව සනාථ කරගැනීමට හා ප්‍රසම්පාදන මාර් ගෝපදේශ අනුව කටයුතු කලයුතුය. |

සම්බන්ධයෙන් සහතික යක් ලබාදිමට හැකියාවක් නොමැති බව වත්මන් ඒජන්තවරුන් විසින් දැනුම් දි ඇති බව අධ්‍යක්‍ෂ මණ්ඩලයට දැනුම් දිමට කටයුතු කරන ලදි. ඒ අනුව මෙම යන්ත්‍රය නැවත අලුත් වැඩියා කිරිම අත්හිටුවිමට අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය කරන ලදි. මේ වන විට වර්ථමානයේ අන්තර් ජාතික වෙළඳපොලේ පැන නැගි ඇති පළිබෝධනාශක පරික්‍ෂා කිරිමේ වැඩපිළිවෙල නිසා මීට පෙර මිලදි ගත් LCMS යන්ත්‍රයක් මිලදි ගැනිමට සිදුවි ඇත.

ඒ අනුව වර්තථමාන ඒජන්තවරුන් පැරණි LCMS යන්ත්‍රම ඔවුන් වෙත ලබාගෙන ඒ සඳහා වියදම් වු සම්පුර්ණ මුදල නව LCMS - MS යන්ත්‍රයක් මිලදි ගන්නා අවස්ථාවේදි අඩුකර ලබාදිමට එකඟ වු බවට දැනුම් දි ඇත. නව යෝජනාව පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබන අතර ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව මෙම යෝජනාව ක්‍රියාත්මක කල හැකි ආකාරය සොයා බලා වාර්තා කරන ලෙස දැනුම් දි ඇත. තවද මේ වන විට අල්ලස් හෝ දුෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේද පරික්‍ෂණයක් පැවැත්වෙන අතර එමගින් අනාවරණය වන කරුණු මත කටයුතු කරනු ලැබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.43,977,748 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.93,322,795ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.49,345,047 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම සියයට 19.47කින් අඩුවීම සහ පරිපාලන වියදම් සියයට 8.9 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

| විෂයය | 2018 | 2017 | විචලනය වාසි /(අවාසි) |
|---|---|---|---|
| | රු. | රු. | % |
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන | | | |
| - පුනරාවර්තන | 165,800,000 | 153,500,000 | 8.00 |
| - ප්‍රාග්ධන | 50,000,000 | 17,500,000 | 185.71 |
| ලියාපදිංචි ගාස්තු | 179,634,806 | 183,316,794 | (3.65) |
| ප්‍රචාරන හා ප්‍රවර්ධන අරමුදලින් මාරුකිරීම | 12,441,000 | 45,500,000 | (72.65) |
| මූල්‍ය ආදායම | 103,020,269 | 109,265,725 | (5.72) |
| වියදම | | | |
| සංවර්ධන වියදම් | 56,439,112 | 18,780,613 | (200.52) |
| පරිපාලන වියදම් | 382,786,592 | 351,504,928 | (8.90) |
| මූල්‍ය වියදම | 57,486,825 | 80,863,240 | 28.91 |

සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරන හා ප්‍රවර්ධන අරමුදලින් මණ්ඩලයේ ආදායමට මාරුකරන ලද මුදල, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 72.65කින් අඩුකර තිබූ නමුත් ඒ සඳහා අනුගමනය කරන ලද පදනම විගණනයට අනාවරනය නොවීය.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අළුත්වැඩියා හා නඩත්තු වියදම සියයට 28.61කින් වර්ධනය, ප්‍රදාන වශයෙන් පරිපාලන වියදම් වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාත පිළිවෙලින් 7.62 හා 10.25 ක ඉහල අගයක් විය. ප්‍රවාරන හා ප්‍රවර්ධන අරමුදලේ කෙටිකාලීන ආයෝජන ස්ථාවර තැන්පතු මුළු ජංගම වත්කම් වලින් සියයට 76ක් නියෝජනය වීම ඊට බලපා තිබුණි.පසුගිය වර්ෂයේ සියයට 13.44ක් වූ මෙහෙයුම් අතිරික්තය සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් වැඩිවීම සහ ආදායම අඩුවීමත් සමග සියයට 1.58ක් දක්වා පිරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හදුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශක්‍යතා අධ්‍යනය කින් තොරව ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස්" එලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත රු.62,603,006 ක අලාභයක් දැරීම සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමා ත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරීක්ෂාකාරී ලෙස කටයුතු කළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතු බව සඳහන් කර තිබුණද, ඒඅනුව කටයුතු කර නොතිබුණි. | අංක - PI/3/2/1/SLTB-72 හා 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය 2017/461/23 දිනැති අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ එවකට පැවති අධ්‍යක්‍ෂ මණ්ඩය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අවස්ථාවේදි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පැහැදිළි තීරණයක් ලබා දී නොතිබීම හේතුවෙන් ඉදිරි පියවර ගැනි මට හැකියාවක් නොතිබුණි. | වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කර වැවිලි කර්මාන්ත අමා ත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කලයුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.124,037,913 ක් වැයකර ගොඩනැගිලි දෙකක් ඉදිකර අවසන්කර තිබියදී එම ඉඩම් දෙකෙහි අයිතිය මණ්ඩලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් දෙකෙහි ගොඩනැගිලි ඉදිකිරිම සඳහා එම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තේ මණ්ඩලය වෙත බලය පවරා ඇති අතර එම ඉඩම් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවමින් පවති. | කඩිනමින් ඉඩම් අයිතිය පවරාගැනීමට කටයුතු කලයුතුය. |

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පසුගිය වර්ෂයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා හානියට පත් කර්මාන්ත ශාලා සඳහා සහනාධාර ගෙවීම් කිරීමේ දී එක් කර්මාන්ත ශාලාවක් විසින් ඉදිරිපත් කරනු ලබන මාසික වාර්තාවන්හී (ටී.සී.5) දැක්වෙන හානි වූ තොග ප්‍රමාණයට වඩා වැඩි තොග ප්‍රමාණයකට ගෙවීම් කිරීම හේතුවෙන් ඒ සඳහා රු.714,455ක් වැඩිපුර ගෙවා තිබූ නමුත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | නියමිත මුදල අයකර ගැනිමට කටයුතු කරමින් පවති. | අයකර ගැනිමට කටයුතු කලයුතුය. |
| (ආ) සන්නාම ප්‍රවර්ධන වැඩසටහන සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ අපනයනකරුවන් 18 දෙනෙකු තෝරාගෙන ඒ සඳහා රු. 400,238,711ක් වැය කිරීමට අපේක්ෂා කලද, අපනයනකරුවන් 04 දෙනෙකු සමඟ පමණක් ගිවිසුම්ගතවීම සිදුවීම සහ තේ ප්‍රවර්ධන අරමුදලේ ඉපැයීම් වලින් රු.බිලියන අටක් යොදවා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ගෝලීය තේ ප්‍රවර්ධන වැඩසටහනේ නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් තෝරාගෙන වෙළඳ දැන්වීම් නිර්මාණ කටයුතු වෙනුවෙන් රු.199,674,721 ක් දරා තිබියදී, මාධ්‍ය කටයුතු අවසන් නොවීම හේතුවෙන් අපේක්ෂිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ ප්‍රවර්ධන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 18.87 කින් වැඩිපුර දරා තිබුණ ද, තේ අපනයන ප්‍රමාණය සියයට 2.21කින් පහත වැටී තිබුණි. | ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන මේ වන විට ආරම්භ වී නොමැති අතර ඒ සඳහා අවශ්‍ය වන නිර්මාණ සඳහා මූලික වියදම් සිදුකර ඇත. එබැවින් ප්‍රවර්ධන වියදමට ඉහත සඳහන් නිර්මාණවලට වැය කර ඇති මුදල එකතු කල විට ප්‍රවර්ධන වියදම වැඩි වී ඇත. 2018/2019 සන්නාම ප්‍රවර්ධන වැඩසටහන සඳහා 2018 අගෝස්තු 01 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව 2018 සැප්තැම්බර් 2 දින අයදුම්පත් කැඳවා පුවත්පත් දැන්වීම ක් ප්‍රචාරණය කරන ලදි. ඒ අනුව 2018 සැප්තැම්බර් 21 වන දින අයදුම්කරුවන් 20 දෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කරන ලදි.ඒ අනුව එම අයදුම්පත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 සැප්තැම්බර් 25 වන දින අනුමත කරන ලද ඇගයීම් කමිටුව මගින් ඇගයීමට ලක් කරන ලදි.<br><br>ඒ අනුව අයදුම්කරුවන් 18 දෙනෙකු 2018/2019 සඳහා ප්‍රතිලාභ ලැබීම සුදුසුකමක් පමණි. ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල | ප්‍රවර්ධන කටයුතු කලීනව හා වඩා ඵලදායී අයුරින් සිදු කලයුතුය. |

අනුමැති 2018 ඔක්තෝබර් 31 වන දින වන අතර මේ වන විට අදාල සැලසුම් අවසන් කරන ලද අයදුම්කරුවන්ගේද සැලසුම් මේ වන විට තේ මණ්ඩලය වෙත ලැබෙමින් පවතින අතර ඉදිරි මාසය ඇතුළත එම ගිවිසුම් වලට එළඹීමට නියමිතය.

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ අලෙවි මධ්‍යස්ථානය සඳහා 2015 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.2,899,510ක වටිනා කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා පරිගණක භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි. | සඳහන් කර ඇති ලී බඩු සහ කාර්යාලීය උපකරණ සවිකිරීම්වලින් කොටසක් දැනටමත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරිහරණයට යොදා ගෙන ඇති අතර ඉතිරි අයිතමයන් පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවා විකිණීමට කටයුතු කර ඇත. එනමුත් තක්සේරු මිලට වඩා අඩුවෙන් මිළ ගණන් ඉදිරිපත් වූ අයිතමයන් කිහිපයක් අපහරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාගැනීම පිණිස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව විසින් ඉදිරිපත් කරන නිර්දේශ අනුව ඉදිරියේදි එම වත්කම් පිළිබඳව කටයුතු කරනු ලැබේ. | මණ්ඩලයට අවාසිදායක තත්වයන් අවමවන පරිදි කටයුතු කලයුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය මගින් රු.260,200,000ක් ප්‍රතිපාදන සලසා තිබූ තේ කර්මාන්තයට තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහාවන උපදේශක සේවා වෙනුවෙන් රු.885,000 ක් දරා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල කාර්යය ආරම්භකර නොතිබුණි. | අදාල ප්‍රසම්පාදනය අවසන් කිරීම පිණිස තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලබාදීම සඳහා එක් එක් ලංසු කරුවන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා මේ අවස්ථාවේදි පරීක්ෂාකරමින් පවතින අතර ඉදිරි මාස 2 තුලදි මෙම ප්‍රසම්පාදනය අවසන් කල හැකි වේ. | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් ප්‍රකාරව කාලීනව ඉටු කලයුතුය. |